# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1357 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 22/08/2024<br>පැය 1145 |

## මාධ්‍ය නිවේදනය

### ඓතිහාසික මෝදර දේවාලයේ ඇසළ මහා පෙරහර වෙනුවෙන් කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ වාහන ගමනාගමනය සීමා කිරීම.

අම්බලන්ගොඩ පොලිස් වසමේ ඓතිහාසික මෝදර දේවාලයේ ඇසළ මහා පෙරහැර 2024.08.23 වන දින සහ 24 දෙදින තුළ ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ගයේ විථි සංචාරය කිරීමට නියමිතව ඇත.

මෙම පෙරහර 2024.08.23 වන දින දහවල් 0100 සිට රාත්‍රී 0800 දක්වා කාලය තුල මෝදර දේවාලයෙන් ආරම්භ වී දේවාල මාර්ගය ඔස්සේ හිරේවතන බුදු පිළිමය තෙක් ගමන් කර අම්බලන්ගොඩ පරණ පාර මහා විදීය ඔස්සේ සිරිකත වටරවුම දක්වා ගමන් කර ගාලු - කොළඹ ප්‍රධාන මාර්ගයට පිවිස ගාල්ල දෙසට ගමන් කර ඌරවත්ත පාලම අසලන් දේවාල මාර්ගය ඔස්සේ දේවාලය වෙත පැමිණීමට නියමිතය.

තවද, 2024.08.24 වන දින රාත්‍රී 0900 සිට අළුයම 03.00 දක්වා කාලය තුල විහාරස්ථානයෙන් ආරම්භ වී ඉහත මාර්ගය ඔස්සේ දේවාලය වෙත පැමිණීමට නියමිතය.

ඉහත කාලයන් තුල ගාල්ල - කොළඹ මාර්ගය භාවිතා කරන මහජනතාව සහ රියදුරන් පහත විකල්ප මාර්ගයන් භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග**

- ගාල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය කරන වාහන එක් මංතීරුවක ගමන් කළ හැක.

- කොළඹ දෙස සිට ගාල්ල දෙසට ගමන් ගන්නා වාහන ( බර වාහන හැර ) විකල්ප මාර්ගය වන සංඝරාජ විහාරය අසලින් කැපු ඇළ හන්දිය හරහා පොල්වත්ත හන්දිය හරහා අම්බලන්ගොඩ කම්කරු කාර්යාලය දෙසින් ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ගයට අවහිර වීගාල්ල දෙසට ගමන් කළ හැක.

ඉහත නිවේදනය මහජනතාවගේ සහ රියදුරන්ගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**